කර්මාන්ත අමාත්‍යාංශය
கைத்தொழில் அமைச்சு
Ministry of Industries













# සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

## කාර්ය සාධන විශ්ලේෂණ වාර්තාව

සැලසුම් අංශය - 2024

# සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

## 1. හැඳින්වීම

2007 මැයි මස 03 වන දින සිට ක්‍රියාත්මක වන 2007 අංක 07 දරන සමාගම් පනත, සමිති ආඥා පනත, 1935 අංක 61 දරණ සීට්ටු ආඥාපනත හා 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත මඟින් දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන් ඉටු කිරීම, නියාමනය හා මෙහෙයවීම සිදු කරනු ලබයි.

එසේම 2017 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුවෙන් ලබාදෙනු ලබන සේවාවන් මාර්ගගත ක්‍රමයට සැපයීම කෙරෙහි අවධානය යොමු විය. ඒ අනුව 2018 වර්ෂයේදී එහි පළමු පියවර ලෙස සමාගම් සංස්ථාපනය මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කිරීම ආරම්භ කරන ලද අතර මේ වන විට මෙම දෙපාර්තමේන්තුව දවසේ පැය විසි හතරම real-time live, eROC පද්ධතිය හරහා මාර්ගගත ක්‍රමයට සියළුම සේවාවන් සපයන රජයේ දෙපාර්තමේන්තුවකි.

➢ <u>**ආයතනයේ දැක්ම හා මෙහෙවර**</u>

**දැක්ම**

**ශ්‍රී ලංකාවේ ව්‍යාපාර අංශ ආවරණය කරමින් සංස්ථා යහපාලනය පිළිබඳව හැදියාවක් ක්‍රම ක්‍රමයෙන් බිහි කිරීමට සමත් සක්‍රීය නියාමන අධිකාරියක් ඇති කිරීම තුළින් විශ්වාසනීය ව්‍යාපාරික පසුබිමක් සංවර්ධනය කිරීම හා පෝෂණය කිරීම**

**මෙහෙවර**

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව රජයේ ආර්ථික ප්‍රතිපත්තියට හා වෙළෙඳ ප්‍රතිපත්තියට අනුකූලතාවයක් ඇති වන සේ අදාළ පනත් යටතේ ව්‍යාපාර හා අනෙකුත් ආයතන සඳහා නීතිමය තත්ත්වයක් ලබා දීමට හා ඒවායේ කාර්යයන් ක්‍රමවත් කිරීමට පරිශ්‍රමයක් දරයි.**

➢ <u>**අරමුණු හා ප්‍රධාන කාර්යයන්**</u>

**අරමුණු**

- 2007 අංක 07 දරණ සමාගම් පනත
- සමිති ආඥාපනත - 123 වන අධිකාරිය
- 1935 අංක 61 දරණ සීට්ටු ආඥාපනත
- 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත

මගින් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති මූලික කාර්යයන් ඉටු කිරීම ,නියාමනය හා මෙහෙයවීම.

**ප්‍රධාන කාර්යයන්**

- පෞද්ගලික සමාගම්, පොදු සමාගම්, ඇපයෙන් සීමිත සමාගම්, සීමා රහිත සමාගම් , සහ ලැයිස්තුගත සමාගම් සංස්ථාපනය කිරීම.
- විදේශීය සමාගම් සහ අක්වෙරළ සමාගම්, සමිති, පොදු කොන්ත්‍රාත්, උකස් බැඳුම්කර, ඍණපත්‍ර, ගණන් පරීක්ෂකවරුන් සහ සමාගම් ලේකම්වරුන් ලියාපදිංචි කිරීම.
- සමාගම් පනත සහ සමිති ආඥා පනත අනුව සමාගම් සහ සමිති වල තොරතුරු යාවත්කාලීන කිරීමට අදාල ලේඛන ලියාපදිංචි කිරීම.
- සමාගම් ඈවර කිරීම හා විසුරුවා හැරීම
- සමාගම්/සමිති වලට අදාල සියළුම තොරතුරු යාවත්කාලීන කිරීම
- සහතික පිටපත් නිකුත් කිරීම, මහජනතාව වෙත තොරතුරු ලබා දීම.
- ලේඛන තහවුරු කිරීම.
- ගාස්තු එකතු කිරීම හා සැසඳීම.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත අවශ්‍ය තොරතුරු, සහතික පිටපත් ලබා දීම හා අවශ්‍ය සහාය ලබා දීම

**ඉලක්ක**

- ❖ Electronic Signature හඳුන්වා දීම
- ❖ සමාගමක් සංස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය සරල කිරීම
- ❖ නාමය අනුමත කිරීමේ ක්‍රියාවලිය සරල කිරීම
- ❖ වරාය නගර සංවර්ධන කොමිසම වෙත ඇදී එන ආයෝජකයන් ආශ්‍රයෙන් අක් වෙරළ සමාගම් ලියාපදිංචි කර ගැනීම
- ❖ ජාතික හැඳුනුම්පත තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය හඳුන්වා දීම
- ❖ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය වැඩි කර ගැනීම හා පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම
- ❖ System Development of Beneficial Ownership
- ❖ අවසාන ආයෝජකයින් හට ආකර්ශනීය සේවාවක් ලබා දී ඉහළ වෙළඳ ප්‍රජාවක් බිහිකර එමඟින් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම.

අභියෝග

- රටේ ආර්ථිකය ක්‍රමිකව යථා තත්වයට පත්වීමත් සමඟ වාර්ෂිකව නව සමාගම් 20,000ක් පමණ අළුතින් සංස්ථාපනය වේ. එසේ සමාගම් සංඛ්‍යාව වැඩි වුව ද ඊට සාපේක්ෂව දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව වැඩි නොවීම හමුවේ වැඩි වන සමාගම් සංඛ්‍යාවට කාර්යක්ෂමව හා ඉක්මන් සේවාවන් ලබා දීම ගැටළුවක් වී ඇත.

- අනුමත නිලධාරීන් 184 ක් සහිත දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයෙන් තනතුරු 48ක් පුරප්පාඩු වී පවතී. එනම් කාර්ය මණ්ඩලයෙන් හතරෙන් එකකට ආසන්න තනතුරු ප්‍රමාණයක් පුරප්පාඩු වී පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තු කාර්ය කළමණාකරණය කිරීම අපහසු වී ඇත.

- e–RoC ව්‍යාපෘතිය අඛණ්ඩව යාවත්කාලීන කරමින් පවත්වාගත යුතුය. එහිදී අවශ්‍ය වන උපාංග හා සේවාවන් කඩිනමින් හා ඉහළ ප්‍රමිතියකින් යුක්තව ලබාගත යුතු අතර ඒවා ඉහළ වෙළඳපොළ වටිනාකමකින් යුක්තය. e–RoC පද්ධතිය ප්‍රශස්ථ ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය සේවාවන් ලබා ගැනීමේදී හා එය නඩත්තු කිරීමේදී එකී වියදම් දැරිය යුතු වන්නේ ද රජයේ නියමිත රෙගුලාසි හා නියමයන් අනුවය. එසේ රජයේ රෙගුලාසි හා නියමයන් අනුව කටයුතු කිරීමේදී වියදම් සීමාකිරීම් සහ ක්‍රියා කිරීමට නොවැලැක්විය හැකි යම් කාලයක් ගත වීම හේතුවෙන් ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය යුතු හා මිල අධික ඉහළ ප්‍රමිතියෙන් යුතු සේවා අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම දැවැන්ත අභියෝගයකි.

- e–RoC පද්ධතිය යටතේ මාර්ගගත ක්‍රමය මගින් සම්පූර්ණයෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සේවා සැපයීම සිදු වන බැවින් එම ක්‍රියාවලිය නියාමනය කිරීම සහ යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා තොරතුරු තාක්ෂණ අංශයක් පිහිටුවා ඇත. එම අංශය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ අධ්‍යක්ෂවරයකු, සහකාර අධ්‍යක්ෂවයකු, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් 03දෙනෙකු හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාරවරුන් 06 දෙනෙකු සහිත කාර්ය මණ්ඩලයක් අනුමත වී ඇත. නමුත් පරිගනක පද්ධතියක් මගින් සියලුම සේවා සපයන මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන්නේ සහකාර අධ්‍යක්ෂවරයෙකු හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන් 02ක් පමණක් වන අතර එම අංශයේ ඉතිරි සියලු තනතුරු පුරප්පාඩු වී පවතී. මෙම තනතුරු පුරප්පාඩු වී පැවතීම තොරතුරු තාක්ෂණ අංශයේ කටයුතු නිසි පරිදි පවත්වා ගෙන යාමට අභියෝගයක් වී ඇත.

- තාක්ෂණයට අනුගත වීමට අකමැති පිරිසක් සිටීම ද ඔවුන්ගේ සෘණාත්මක අදහස් හා ක්‍රියාවන් සමග සාර්ථකව ඉදිරියට යාම ද අප ඉදිරියේ ඇති අභියෝගයකි.

- e–RoC පද්ධතිය සමග අනෙකුත් රාජ්‍ය ආයතන ඒකාබද්ධ කිරීම රජයේ ප්‍රතිපත්තිය වුවද එම ආයතන මෙම පද්ධතිය හා සම්බන්ධ වීමට හැකි මට්ටමට තවම සංවර්ධනය වී නොතිබීම හා යම් ආයතන ඒ සඳහා දක්වන අකමැත්ත නිසා ඒකාබද්ධ වීම අපහසු වී ඇත.

## 2. ප්‍රගතිය

### මූල්‍ය තත්වය

#### සමාගම් අරමුදලේ ගිණුම

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|
| මුළු ආදායම (රු. මි.) | 633.69 | 740.27 | 793.54 | 631.56 | 549.64 | 719.71 | 1015.61 |
| වියදම (රු. මි.) | 70.36 | 83.25 | 92.75 | 106.90 | 131.14 | 138.23 | 166.23 |
| අතිරික්තය (රු. මි.) | 563.33 | 657.02 | 700.79 | 524.66 | 418.50 | 581.48 | 849.38 |

#### ඒකාබද්ධ අරමුදලේ ගිණුම

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|
| මුළු ආදායම (රු. මි.) | 232.96 | 163.76 | 299.45 | 399.87 | 179.45 | 166.78 | 244.20 |
| වියදම (රු. මි.) | 52.95 | 69.17 | 77.37 | 82.94 | 78.46 | 85.07 | 176.93 |

#### වත්කම්

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|
| ජංගම වත්කම් (රු. මි.) | 2,297.50 | 1,440.93 | 1,256.47 | 85.17 | 74.63 | 152.81 | 533.19 |
| ජංගම නොවන වත්කම් (රු. මි.) | 2,243.38 | 3,782.36 | 4,695.73 | 6,389.49 | 6,877.42 | 8,019.99 | 8495.82 |

#### බැරකම්


| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|
| ජංගම බැරකම් (රු. මි.) | 30.14 | 5.25 | 17.78 | 14.76 | 69.67 | 86.38 | 146.78 |
| ජංගම නොවන බැරකම් (රු. මි.) | - | - | - | - | - | - | - |

## 3. විශ්ලේෂණය

### i. සමාගම් සංස්ථාපනය - අනුමත අයදුම්පත් සම්බන්ධ ප්‍රගතිය - (2017-2023)

| විස්තරය | භෞතික ප්‍රගතිය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
| නාම අනුමත කිරීමට ඉදිරිපත් කළ අයදුම්පත් සංඛ්‍යාව | 16,512 | 23,304 | 16,967 | 18,412 | 26,534 | 25,352 | 33,223 |
| අනුමත කළ සංඛ්‍යාව | 14,525 | 13,474 | 12,184 | 17,653 | 26,180 | 24,327 | 32,252 |
| ක්‍රියාත්මක නොවූ අයදුම්පත් සංඛ්‍යාව | 1,650 | 588 | 05 | 834 | 0 | 0 | 0 |
| ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සංඛ්‍යාව | 337 | 9,245 | 4,308 | 4 | 20 | 44 | 186 |

**අනුමත අයදුම්පත් සම්බන්ධ ප්‍රගතිය - (2017-2023)**





**සටහන 1**

සටහන 1 අනුව, නාම අනුමත කිරීමට ඉදිරිපත් කළ අයදුම්පත් සංඛ්‍යාව ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැමිණ 2022 වර්ෂයේදී තරමක් අඩු වී නැවත 2023 වර්ෂයේදී වැඩි වී ඇත. නමුත් ක්‍රියාත්මක නොවූ අයදුම්පත් සංඛ්‍යාව 2020 වසරේ 834ක් පැවතියද 2021න් පසු එය ශුන්‍ය අගයක් වී ඇත.

## *ii.* <u>විසුරුවා හැර ඇති සහ අවලංගු කර ඇති සමාගම් *(2017-2023)*</u>

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|
| සාමාජිකයින් ස්වේච්ඡාවෙන් ඇවර කිරීම | 46 | 52 | 43 | 21 | 09 | 27 | 31 |
| ණයහිමියන් ස්වේච්ඡාවෙන් ඇවර කිරීම | 10 | 11 | 09 | 05 | 06 | 05 | 7 |
| අධිකරණයෙන් ඇවර කිරීම | 02 | 04 | 06 | 01 | 03 | 04 | 6 |
| පනතේ යටතේ 394 නම කපා හැරීම | 298 | 332 | 381 | 210 | 209 | 212 | 711 |
| ඒකාබද්ධ කිරීම හේතුවෙන් නම කපා හැරීම | 32 | 74 | 46 | 29 | 15 | 4 | 30 |
| විදේශ සමාගම්වල නාමය කපා හැරීම | 388 | 0 | 0 | 0 | 13 | 13 | 19 |
| එකතුව | 776 | 473 | 485 | 266 | 255 | 265 | 804 |




**සටහන 2**


### iii. සමිති ලියාපදිංචි කිරීම (2017-2023)


| Type of the Society | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|
| විහාරස්ථාන | 16 | 18 | 06 | 01 | - | - | - |
| සර්වෝදය | - | - | - | - | - | - | - |
| මිතුරු සංවර්ධන | 48 | 09 | - | - | - | - | - |
| ඉසුරු සංවර්ධන | - | - | - | - | - | - | - |
| කාන්තා සමිති | - | - | - | - | - | - | - |
| ග්‍රාමීය සංවර්ධන | - | - | - | - | - | - | - |
| ග්‍රාමශක්ති | - | 1037 | 2431 | 98 | 01 | - | - |
| ජල | - | - | - | 09 | 01 | - | - |
| වෙනත් (සුභසාධක) | 15 | 22 | 18 | 32 | 29 | 22 | 36 |
| ප්‍රජා සංවර්ධන | - | - | - | - | - | - | 01 |
| ලියාපදිංචි වීමට ඇති | - | - | - | - | 01 | - | - |
| එකතුව | **79** | **1086** | **2455** | **140** | **32** | **22** | **37** |

### iv. පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම (2017-2023)

| වර්ෂය | ප්‍රමාණය | ආදායම (රු.) |
|---|---|---|
| 2017 | 19275 | 31,174,500.00 |
| 2018 | 24743 | 39,502,500.00 |
| 2019 | 23962 | 41,895,000.00 |
| 2020 | 19233 | 44,608,336.00 |
| 2021 | 22445 | 50,344,000.00 |
| 2022 | 13216 | 29,066,000.00 |
| 2023 | 22632 | 49,894,000.00 |

පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම






## 4. ඉහත දත්ත හා තොරතුරු පදනම්ව පවතින තත්වය පිළිබඳව ආයතනයේ නිරීක්ෂණ

- 2022 හා 2023 වසරවල රටේ පැවති ආර්ථික පරිහානිය සමාගම් විසුරුවා හැරීමට ඉදිරිපත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව අනුව පෙනී යයි.
- කෙසේ වෙතත් 2022 හා 2023 වසරේදී රටේ ආර්ථික පරිහානිය එහි උච්ඡ ස්ථානයේ පැවතිය ද එය නොතකා සමාගම් සංස්ථාපනය වේගවත් වී ඇත.
- 2023 වසරේ දී ලියාපදිංචි සමාගම් සංඛ්‍යාව 32,252 වන අතර 2017,2018,2019 යන වසර තුනේම සංස්ථාපිත වූ මුළු සමාගම් ගණනට සමානය. මේ අනුව නව ව්‍යවසායකයින් බිහිවීමක් පෙන්නුම් කෙරේ.
- රජය තම වියදම් පාලනය කර ගැනීමේ අරමුණින් හඳුන්වා දුන් දැඩි මූල්‍ය සීමා කිරීම් නිසා 2022 දී පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත් ගණන 13,216 දක්වා කැපී පෙනෙන ලෙස පහත වැටී ඇති අතර, එයින් පසු 2023 වසරේදී ලියාපදිංචි වූ පොදු කොන්ත්‍රාත් ගණන 22,632 දක්වා ඉහළ යෑමෙන් රජය තම දැඩි මූල්‍ය සීමාවන් ලිහිල් කිරීම නිරූපණය කරයි.
- දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන අයදුම්පත් වල විශාල ප්‍රමාණාත්මක වර්ධනයක් තිබුණ ද එයට සාපේක්ෂව කාර්ය මණ්ඩලය වැඩි වී නොමැත. එම තත්වය තුළ දෙපාර්තමේන්තුවේ දැනට සිටින කාර්ය මණ්ඩලයේ කැපවීම පෙන්නුම් කරයි. කෙසේ වෙතත් සුදුසු දිරිගැනිවීමේ ක්‍රමවේදයක් ඉක්මනින් ක්‍රියාවට නොනැගුණ හොත් කාර්ය මණ්ඩලයේ මෙම කැපවීම අඛණ්ඩව පවත්වාගෙන යාම ගැටළුවක් වනු ඇත.

## 5. ඉදිරි අභියෝග සහ ඒවා ජයගැනීම සඳහා යෝජනා

### ඉදිරි අභියෝග

- වැඩි වන සමාගම් ගණන හමුවේ එම සමාගම් වෙනුවෙන් ලබා දිය යුතු නොයෙකුත් සේවාවන් ද ඉහළ යයි. සුදුසු සේවක මණ්ඩලය නොමැතිව මෙම සමාගම් වලට ප්‍රමාණාත්මක හා ගුණාත්මක සේවාවන් ලබා දීම අභියෝගයකි.
- රජයේ පවත්නා බඳවා ගැනීමේ සීමා නිසා මාණ්ඩලික නිලධාරීන් බඳවා ගැනිම පිළිබඳ මතුව ඇති ගැටළු.

### ඒවා ජයගැනීම සඳහා යෝජනා

- දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය වැඩි කර ගැනීම හා පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම.
- නිලධාරීන්ට අවශ්‍ය පුහුණු ලබා දීම හා ආකල්ප සංවර්ධනය කිරීම.
- වෙනත් ආයතන සමඟ මාර්ගගතව සම්බන්ධ වීම සඳහා අවශ්‍ය System Development සිදු කිරීම.